# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2261/55 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 07 දරන වෙළඳ නැව් (භාණ්ඩ සහ තෙල් ඉන්ධන ප්‍රවාහන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ VI වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.

1A - G 35894 — 510 (2022/01)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### මේ නියෝගවල අදාළත්වය

2. (1) මේ නියෝගයේ (2) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, මේ නියෝග, භාණ්ඩ පටවා ඇති හෝ පැටවීමට අදහස් කරන කවර හෝ තැනක නාවික කටයුතුවල යෙදෙන ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන, වෙනත් යම් විදේශීය නැව්වලට අදාළ විය යුතු ය.

(2) අන්තරාදායක භාණ්ඩ සහ සමුද්‍රීය දූෂණ කාරක ප්‍රවාහනය සම්බන්ධව 2022.01.06 දිනැති අංක 2261/56 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 08 දරන වෙළඳ නැව් (අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය) නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග සියලුම භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. එම නියෝගවල ඇති යම් නියමයක් මගින් මේ නියෝගවලින් විධිවිධාන සලස්වා ඇති ප්‍රවාහනය පිළිබඳ යම් අංශයක් නියාමනය කරනු ලබන අවස්ථාවක දී, එම නියෝග ඒ තාක් ප්‍රමාණයකට අදාළ විය යුතු ය.

3. (1) සම්මුතිය හෝ සම්මුතියේ සඳහන් කරනු ලබන ලේඛන මගින්, යම් විශේෂ උපකරණයක කොටසක් හෝ එහි යම් ආකෘතියක් නැවකට සපයනු ලැබිය යුතු බවට හෝ නැවක රැගෙන යා යුතු බවට යම් විශේෂ සැපයීමක් සිදු කරනු ලැබිය යුතු බවට නියම කරනු ලබන අවස්ථාවක දී, (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එහි විභාග කිරීම් මගින් හෝ අන්‍යාකාරයකින්, වෙනත් යම් උපකරණ කොටසක් හෝ සැපයීමක් අවම වශයෙන් සම්මුතිය මගින් හෝ සම්මුතියේ සඳහන් කරනු ලබන තොරතුරු මගින් නියම කරනු ලබන පරිදි ඵලදායී වන බවට හෝ සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින්, එවැනි යම් උපකරණ කොටසක් එම නැවට සපයනු ලැබීම සඳහා හෝ එම නැවේ රැගෙන යනු ලැබීම සඳහා හෝ එම නැව වෙත වෙනත් යම් සැපයීමක් සිදු කරනු ලැබීම සඳහා අවසර දෙනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවල කාර්යයන් සඳහා, තාක්ෂණික සහ වෘත්තීමය ප්‍රවීනතාව සහ ස්වාධීනත්වය පිළිබඳ සුදුසු සහ සෑහීමකට පත් විය හැකි සහතික ලබා දෙන්නා වූ, සංවිධානයේ වෙනත් සාමාජික රාජ්‍යයන්හි ආයතන සහ පර්යේෂණාගාර මගින් සිදු කරනු ලබන සත්‍යායනයේ සහ පරීක්ෂණවල ප්‍රතිඵල පිළිගනු ලැබිය යුතු ය.

(3) දළ ටොන් බර 500 ට අඩු භාණ්ඩ නැව් සඳහා, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මුහුදු ගමනේ ආරක්ෂිත ස්වභාවය සහ තත්ත්වයන් සඳහා සම්මුතියේ VI වන පරිච්ඡේදයේ "අ" කොටසේ හෝ "ආ" කොටසේ යම් නිශ්චිත නියමයන් අදාළ කර ගැනීම අවශ්‍ය නොවන බව සලකනු ලබන්නේ නම්, ඔහු විසින් එම නැව් එම නියමයන් වලින් නිදහස් කරනු ලැබිය හැකි ය. එම නැව් විසින් අවශ්‍ය ආරක්ෂාව සහතික කර ගැනීම සඳහා වන වෙනත් ඵලදායී පියවරයන් ගනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සාධාරණ දැන්වීමක් ලබා දීම මගින්, එවැනි යම් නිදහස් කිරීමක් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(4) (3) වන අනු නියෝගය යටතේ නැව්වලට ප්‍රදානය කරනු ලැබ ඇති යම් නිදහස් කිරීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

## II වන කොටස

### භාණ්ඩ සහ තෙල් ඉන්ධන ප්‍රවාහනය

4. ධාන්‍ය වර්ග නොවන තොග නැව් භාණ්ඩ ප්‍රවාහනය IMSBC සංග්‍රහයේ අදාළ විධිවිධාන සමඟ අනුකූල විය යුතු ය.

5. (1) (අ) නැව්කරුවා විසින්, ප්‍රවාහනය කරනු ලැබීමට නියමිත නැව් භාණ්ඩවල නිසි ගබඩා කිරීම සහ ආරක්ෂිත ප්‍රවාහනය සඳහා අවශ්‍ය විය හැකි පූර්වාරක්ෂාවක් ගැනීමේ හැකියාව ලබා දීම සඳහා භාණ්ඩ පැටවීමට පෙර ප්‍රමාණවත් පරිදි භාණ්ඩ පිළිබඳ යෝග්‍ය තොරතුරු නෞකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු වෙත සපයනු ලැබිය යුතු ය.

(ආ) (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද නැව් භාණ්ඩ පිළිබඳ තොරතුරු වලට:

(i) සාමන්‍ය නැව් භාණ්ඩ සම්බන්ධයෙන් සහ නැව් භාණ්ඩ ඒකකවල ගෙන යනු ලබන නැව් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට දී, නැව් භාණ්ඩවල සාමාන්‍ය විස්තරයක්, නැව් භාණ්ඩවල හෝ භාණ්ඩ ඒකකවල දළ ස්කන්ධය සහ නැව් භාණ්ඩවල යම් අදාළ විශේෂ ලක්ෂණ;

(ii) ඝන තොග නැව් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට දී, IMSBC සංග්‍රහයේ 4 වන වගන්තිය මගින් නියම කරනු ලබන තොරතුරු; සහ

(iii) සම්මුතියේ VII වන පරිච්ඡේදයේ 2 වන නියෝගයට අනුකූලව වර්ගීකරණය කර නොමැති, එහෙත් ආපදාවක් ඇති කළ හැකි රසායනික ලක්ෂණ ඇති තොග නැව් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට දී, ඉහත 1(ආ) (ii) වන අනු නියෝගයේ නියම කර ඇති තොරතුරුවලට අමතරව ඒවායෙහි රසායනික ලක්ෂණ පිළිබඳ තොරතුරු;

ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) නැව් භාණ්ඩ ඒකක නැව්වලට පැටවීමට පෙරාතුව, නැව්කරුවා විසින්, එම ඒකකවල දළ ස්කන්ධය නාවික ලේඛනවල ප්‍රකාශිත දළ ස්කන්ධයට අනුකූල වන බවට තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 3 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි, වැසියක් හෝ ට්‍රේලරයක් මත ගෙන යන්නා වූ බහාලුම කෙටි ජාත්‍යන්තර මුහුදු ගමන්වල යෙදෙන රෝ-රෝ නැවකින් පිටතට හෝ එය තුළට පදවනු ලබන අවස්ථාවක දී, එම බහාලුම් සඳහා හැර, බහාලුමක ගෙන යනු ලබන නැව් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට දී, 2016 අගෝස්තු මස 11වන දිනැති අංක 1979/30 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන) නියෝගවලට අනුකූලව, නැව්කරුවා විසින්, මේ නියෝගයේ (1)ආ (i) වන ඡේදයට අනුව දළ ස්කන්ධය සත්‍යායනය කරනු ලැබිය යුතු ය.

(4) සත්‍යායනය කරන ලද දළ ස්කන්ධය නාවික ලේඛනයේ දක්වා ඇති බවට නැව්කරුවා විසින් තහවුරු කරගත යුතු ය. නාවික ලේඛනය-

(අ) නැව්කරුවා විසින් නිසි පරිදි බලය පවරන ලද තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) නැවේ ගබඩා කිරීමේ සැලැස්ම සකස් කිරීමේ දී භාවිත කිරීම සඳහා, නෞකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා විසින් නියම කරනු ලබන පරිදි, ප්‍රමාණවත් පරිදි කල් වේලා ඇතිව, නෞකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා වෙත සහ පර්යන්ත නියෝජිතයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(5) යම් ඇසුරුම්ගත බහාලුමකට අදාළ නාවික ලේඛනයෙහි සත්‍යායනය කරන ලද දළ ස්කන්ධය සපයා නොමැති නම් සහ නෞකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා සහ පර්යන්ත නියෝජිතයා විසින් ඇසුරුම්ගත බහාලුමේ සත්‍යායනය කරන ලද දළ ස්කන්ධය ලබා ගෙන නොමැති නම්, එම බහාලුම නැවට පටවනු නොලැබිය යුතු ය.

6. (1) ධාන්‍ය ප්‍රවාහනයෙහි යෙදෙන නැවක හැර, මේ නියෝග අදාළ වන්නා වූ සෑම නැවකම හිමිකරු සහ නෞකාධිපතිවරයා විසින්, යම් නැව් භාණ්ඩ මුහුදෙන් ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂාවන් විශේෂයෙන් දැක්විය යුතු වන, එම නැව් භාණ්ඩවලට සහ ඒවායෙහි ගබඩා කිරීමට සහ ආරක්ෂා කිරීමට අදාළ යෝග්‍ය ලේඛන නැවෙහි රැගෙන යන බවට තහවුරු කරගනු ලැබිය යුතු ය.

(2) එවැනි ලේඛනයක පහත දැක්වෙන ආරක්ෂිත රීති සංග්‍රහයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය හැකි ය-

(අ) කලින් කල සංශෝධිත පරිදි, A.714(17) යෝජනා සම්මතය මගින් සංවිධානය විසින් සම්මත කරන ලද නැව් භාණ්ඩ ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන ආරක්ෂිත රීති සංග්‍රහය;

(ආ) කලින් කල සංශෝධිත පරිදි, A.715(17) යෝජනා සම්මතය මගින් සංවිධානය විසින් සම්මත කරන ලද දැව කට්ටු නැව් භාණ්ඩ ගෙන යන නැව් සඳහා වන ආරක්ෂිත රීති සංග්‍රහය; සහ

(ඇ) කලින් කල සංශෝධිත පරිදි, A.434(XI) යෝජනා සම්මතය මගින් සංවිධානය විසින් සම්මත කරන ලද ඝන තොග නැව් භාණ්ඩ (BCසංග්‍රහය) සඳහා වන ආරක්ෂිත රීති සංග්‍රහය.

(3) මේ නියෝග අදාළ වන්නා වූ ධාන්‍ය ගෙන යන සෑම නැවකම හිමිකරු සහ නෞකාධිපතිවරයා විසින් ජාත්‍යන්තර ධාන්‍ය සංග්‍රහය නැවෙහි රැගෙන යන බවට තහවුරු කර ගනු ලැබිය යුතු ය.

(4) (අ) ඝන සහ ද්‍රව තොග නැව් භාණ්ඩ නොවන නැව් භාණ්ඩ ගෙන යන සියලු මගී නැව් සහ භාණ්ඩ නැව් සහ අන්තර්ජාතික මුහුදු ගමන් නොවන මුහුදු ගමන්වල යෙදෙන ටොන් පන්සියයට අඩු භාණ්ඩ නැව් විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානයක් විසින් අනුමත කරන ලද නැව් භාණ්ඩ ආරක්ෂා කිරීමේ අත්පොතක් නැවේ රැගෙන යා යුතු ය.

(ආ) 6(4)(අ) වන අනු නියෝගයේ සඳහන් කරන ලද නැව් භාණ්ඩ ආරක්ෂා කිරීමේ අත්පොත යටත් පිරිසෙයින් සංවිධානය විසින් සකස් කරන ලද අදාළ මාර්ගෝපදේශයට සමාන ප්‍රමිතියකින් සකස් කරනු ලැබිය යුතු ය.

7. විෂ සහිත හෝ දැවෙන සුළු වායුවක් විමෝචනය කිරීමට සිදුවිය හැකි හෝ නැව් භාණ්ඩ අවකාශය තුළ ඔක්සිජන් වායුව ක්ෂය වීමට හේතු වන තොග භාණ්ඩ ප්‍රවාහනයේ දී, වාතයේ ඇති වායුන්ගේ හෝ ඔක්සිජන් වායුවේ සාන්ද්‍රණය මැනීම සඳහා සුදුසු උපකරණයක්, එය භාවිත කිරීම සඳහා වන විස්තරාත්මක උපදෙස් ද සහිතව සපයනු ලැබිය යුතු ය. එවැනි උපකරණයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන වර්ගයක විය යුතු අතර එය භාවිත කිරීම සඳහා නාවික පිරිස පුහුණු කරනු ලැබිය යුතු ය.

8. නැව්වල විශේෂයෙන්ම ධූමායන කාර්යය සඳහා, පළිබෝධ නාශක භාවිත කිරීමේ දී උචිත පූර්වාරක්ෂාවන් ගනු ලැබිය යුතු ය. එම පූර්වාරක්ෂාවන්, සංවිධානය විසින් සකස් කරන ලද පහත දැක්වෙන චක්‍රලේඛ එකකින් හෝ වැඩි ගණනකින් සමන්විත විය යුතු ය.

(අ) නැව්වල පළිබෝධ නාශක ආරක්ෂිතව භාවිත කිරීම පිළිබඳ නිර්දේශයන් (කලින් කල සංශෝධිත පරිදි MSC/චක්‍රලේඛ 612);

(ආ) නැව් භාණ්ඩ ධූමායනය සඳහා අදාළ විය හැකි නැව්වල පළිබෝධ නාශක ආරක්ෂිතව භාවිත කිරීම පිළිබඳ නිර්දේශයන් (කලින් කල සංශෝධිත පරිදි MSC.1/චක්‍රලේඛ 1264); සහ

(ඇ) නැව් භාණ්ඩ ප්‍රවාහන ඒකකවල ධූමායනය සඳහා අදාළ විය හැකි නැව්වල පළිබෝධනාශක ආරක්ෂිතව භාවිත කිරීම පිළිබඳ නිර්දේශයන් (කලින් කල සංශෝධිත පරිදි MSC.1/චක්‍රලේඛ 1265).

9. හිමිකරු සහ නෞකාධිපතිවරයා විසින්-

(අ) මුහුදු ගමන පුරාවටම, නැව් තට්ටුව මත හෝ නැව් තට්ටුව යට ගෙන යනු ලබන නැව් භාණ්ඩ, නැව් භාණ්ඩ ඒකක සහ නැව් භාණ්ඩ ප්‍රවාහන ඒකක, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, නැවට සහ එහි ගමන් කරන තැනැත්තන්ට හානියක් හෝ අන්තරායක් සහ ගෙන යනු ලබන නැව් භාණ්ඩ නැති වීමක් සිදු වීම වැළැක්වෙන පරිදි පැටවිය යුතු බව, ගබඩා කළ යුතු බව සහ ආරක්ෂා කළ යුතු බව;

(ආ) මුහුදු ගමන පුරාවටම, නැව් භාණ්ඩ, නැව් භාණ්ඩ ඒකක සහ නැව් භාණ්ඩ ප්‍රවාහන ඒකක, නැවට සහ එහි ගමන් කරන තැනැත්තන්ට හානියක් හෝ අන්තරායක් ඇති වීම වැළැක්වෙන පරිදි ඒකකය තුළ ඇසුරුම් කරනු ලැබිය යුතු බව සහ ආරක්ෂා කළ යුතු බව;

(ඇ) බර නැව් භාණ්ඩ හෝ අසාමාන්‍ය භෞතික මානයන් සහිත නැව් භාණ්ඩ පැටවීම සහ ප්‍රවාහනය කරන අතරතුර දී, නැවට කිසිදු ව්‍යුහාත්මක හානියක් සිදු නොවන බව තහවුරු කිරීම සහ මුහුදු ගමන පුරාවටම ප්‍රමාණවත් ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා උචිත පූර්වාරක්ෂාවන් ගනු ලැබිය යුතු බව;

(ඈ) රෝ-රෝ නෞකාවල නෞකාස්ථ නැව් භාණ්ඩ ඒකක සහ නැව් භාණ්ඩ ප්‍රවාහන ඒකක පැටවීම සහ ප්‍රවාහනය කිරීම අතරතුර දී, විශේෂයෙන්ම එවැනි නැව්වල සහ නැව් භාණ්ඩ ඒකක සහ නැව් භාණ්ඩ ප්‍රවාහන ඒකකවල නෞකාස්ථ ආරක්ෂණ වැඩ පිළිවෙල සම්බන්ධව සහ ආරක්ෂක ස්ථාන සහ කඹවල ශක්තිමත්භාවය සම්බන්ධව උචිත පූර්වාරක්ෂාවන් ගනු ලැබිය යුතු බව;

(ඉ) භාණ්ඩ ප්‍රවාහන බහාලුම්වල, සංශෝධිත පරිදි වූ, ආරක්ෂිත බහාලුම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය (සී.එස්.සී) යටතේ වන ආරක්ෂාව අනුමත කිරීමේ පුවරුවෙහි දක්වා ඇති උපරිම දළ ස්කන්ධයට වැඩියෙන් පටවනු නොලැබිය යුතු බව;

(ඊ) 6(4)(අ) වන අනු නියෝගය අදාළ වන සියලු නැව්වල නෞකාස්ථ නැව් භාණ්ඩ, මුහුදු ගමන පුරාවටම, නැව් භාණ්ඩ ආරක්ෂා කිරීමේ මාර්ගෝපදේශන අත්පොතට අනුකූලව ගබඩා කරනු ලබන බව සහ ආරක්ෂා කරනු ලැබිය යුතු බව;

(උ) භාණ්ඩ නැවෙන් පිටතට සහ නැව තුළට ගෙන යාමට පහසුකම් සහිත 6(4)(අ) වන අනුනියෝගය අදාළ වන සියලු නැව්වල නෞකාස්ථ නැව් භාණ්ඩ, නැව නැංගුරම් ලා තිබෙන ස්ථානයෙන් පිටත් වීමට පෙරාතුව, නැව් භාණ්ඩ ආරක්ෂා කිරීමේ මාර්ගෝපදේශන අත්පොතට අනුකූලව ගබඩා කරනු ලැබිය යුතු සහ ආරක්ෂා කරනු ලැබිය යුතු බව;

තහවුරු කරගත යුතු ය.

10. 1978 ප්‍රොටොකෝලය මගින් වෙනස් කරන ලද 1973 නැව් මගින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ 1 වන ඇමුණුමේ 1 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි, තෙල් හෝ තෙල් ඉන්ධන ගෙන යන නැව්වලට, නැව් භාණ්ඩ ලෙස තොග වශයෙන් එම තෙල් පැටවීමට හෝ තෙල් ඉන්ධන සැපයීමට පෙරාතුව, සංවිධානය විසින් සකස් කරන ලද නිර්දේශයන් මත පදනම්ව, වැදගත් ආරක්ෂක දත්ත පත්‍රිකා සපයනු ලැබිය යුතු ය.

11. (1) මුහුදු ගමන් අතරතුර දව නැව් භාණ්ඩ තොග භෞතික වශයෙන් මිශ්‍ර කිරීම තහනම් වේ. භෞතික වශයෙන් මිශ්‍ර කිරීම යන්නෙන්, නැවේ භාණ්ඩ පොම්ප සහ සැපයුම් මාර්ග, නව අවසාන නිෂ්පාදනයක් සහිත නැව් භාණ්ඩ ලබා ගැනීමේ අදහස ඇතිව විවිධ නැව් භාණ්ඩ දෙකක් හෝ වැඩි ගණනක් අභ්‍යන්තරව සංසරණය කරවීමට භාවිත කරනු ලබන්නා වූ එම ක්‍රියාවලිය අදහස් වේ. මෙම තහනම් කිරීම මගින් නැවේ ආරක්ෂාව සඳහා හෝ සමුද්‍රීය පරිසරයේ ආරක්ෂා කිරීම සඳහා නැව් භාණ්ඩ හුවමාරු කිරීම් භාර ගැනීමෙන් නෞකාධිපතිවරයාව වැළැක්වීම සිදු නොවන්නේ ය.

(2) (1) වන අනුනියෝගයේ ඇති තහනම් කිරීම, මුහුදු පත්ලේ ඇති ඛනිජ සම්පත් සෙවීම සහ උපයෝජනය සඳහා පහසුකම් සැලසීමට භාවිත කෙරෙන නැව්වල එම මෙහෙයුම්වල දී භාවිත කිරීම සඳහා වන නෞකාස්ථ නිෂ්පාදන මිශ්‍ර කිරීමට අදාළ නොවන්නේ ය.

(3) මුහුදු ගමන් අතරතුර දී සිදුවන ඕනෑම නෞකාස්ථ නිෂ්පාදන ක්‍රියාවලියක් තහනම් වේ. නිෂ්පාදන ක්‍රියාවලීන් යන්නෙන්, යම් නැවක නැව් භාණ්ඩ සහ වෙනත් යම් ද්‍රව්‍ය හෝ නැව් භාණ්ඩ අතර සිදුවන යම් රසායනික ප්‍රතික්‍රියාවක් මගින් සිදුවන යම් පරීක්ෂාකාරී ක්‍රියාවලියක් අදහස් වේ.

(4) (3) වන අනු නියෝගයේ ඇති තහනම් කිරීම, මුහුදු පත්ලේ ඇති ඛණිජ සම්පත් සෙවීම සහ උපයෝජනය සඳහා පහසුකම් සැලසීමට භාවිත කෙරෙන නැව්වල එම මෙහෙයුම්වල දී භාවිත කිරීම සඳහා වන නෞකාස්ථ නැව් භාණ්ඩවල නිෂ්පාදන ක්‍රියාවලීන් වලට අදාළ නොවන්නේ ය.

## III වන කොටස

### ධාන්‍ය නොවන තොග නැව් භාණ්ඩ සඳහා වන විශේෂ විධිවිධාන.

12. (1) නැව් භාණ්ඩ තොගයක් පැටවීමට පෙරාතුව, නෞකාධිපතිවරයා සතුව, නැවේ ස්ථායිතාව පිළිබඳ සහ සම්මත පැටවීමේ තත්ත්වයන් සඳහා වන, නැව් භාණ්ඩ සහ ස්ථායිතාව රැක ගැනීමට යොදන පිරවුම් ද්‍රව්‍ය (බැලස්ට්) වල බෙදාහැරීම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අන්තර්ගත වන, සම්මුතියේ II-1වන පරිච්ඡේදයේ 5-1 වන නියෝගයට අදාළව සපයනු ලබන ස්ථායිතා තොරතුරු තිබිය යුතු ය.

(2) (අ) 5(1)(ආ) වන නියෝගයේ සඳහන් සහතිකයේ දක්වා ඇති භාණ්ඩවල තෙතමනය එය ප්‍රවාහනය කළ හැකි තෙතමන සීමාවට වඩා අඩු වන්නේ නම්; හෝ

(ආ) භාණ්ඩවල තෙතමනය එම සීමාවට වඩා වැඩි නම්, භාණ්ඩ එහා මෙහා කිරීම සම්බන්ධයෙන් වන විට දී ප්‍රමාණවත් ස්ථායිතාවක් සහ නැවට ප්‍රමාණවත් ව්‍යුහාත්මක පරිපූර්ණත්වය ඇති බව සහතික කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි උචිත ආරක්ෂක පිළියෙළ කිරීම් සිදු කරනු ලබන්නේ නම්;

මිස, නෞකාධිපතිවරයා විසින්, ද්‍රව බවට පත්විය හැකි සාන්ද්‍රිකයන් හෝ වෙනත් නැව් භාණ්ඩ පැටවීම සඳහා භාරගනු නොලැබිය යුතු ය.

(3) 5(1)(ආ)(iii) වන නියෝගයේ සඳහන් නැව් භාණ්ඩ තොගයක් පැටවීමට පෙරාතුව, එය ආරක්ෂිතව ගෙන යාම සඳහා ගත යුතු උචිත විශේෂ පූර්වාරක්ෂාවන් ගනු ලැබිය යුතු ය.

(4) නෞකාධිපතිවරයා විසින්-

(අ) (1) වන අනු නියෝගයෙන් නියම කරනු ලබන තොරතුරු තමා සන්තකයෙහි ඇත්තේ නම්;

(ආ) යෝජිත පැටවුම් පිළියෙළ කිරීම් මගින්, (1) වන උප-නියෝගය යටතේ සපයන ලද ස්ථායිතා තොරතුරුවලට අනුකූලව, ප්‍රමාණවත් ස්ථායිතාවක් සහතික කෙරෙන බවට ගණනය කිරීම් මගින් තමා සෑහීමකට පත් වන්නේ නම්; සහ

(ඇ) (3) වන අනු නියෝගය අදාළ වන්නා වූ නැව් භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට දී, එම අනු නියෝගයෙන් නියම කරනු ලබන පූර්වාරක්ෂාවන් ගෙන ඇති බවට තමා සෑහීමකට පත් වන්නේ නම්;

මිස පැටවීම සඳහා නැව් භාණ්ඩ භාරගනු නොලැබිය යුතු ය.

13. (1) (අ) මේ නියෝගයේ, "පර්යන්ත නියෝජිතයා" යන්නෙන්, නැවට බඩු පැටවීම හෝ නැවෙන් බඩු බෑම සිදු කරන අවස්ථාවේ දී, එම නැවට අදාළව පර්යන්තය හෝ ස්ථානය මගින් මෙහෙයවනු ලබන මෙහෙයුම් සඳහා වගකීම දරන්නා වූ, එම පරියන්තය හෝ වෙනත් ස්ථානය විසින් පත් කරනු ලබන, යම් තැනැත්තකු අදහස් වේ.

(ආ) (3) වන සහ (5) වන අනු නියෝගවල කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාවේ යම් වරායක නිසි බලධරයා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විය යුතු ය. වරායේ යම් පර්යන්තයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මෙහෙයවනු නොලබන්නේ නම්, එවිට පර්යන්තයේ මෙහෙයුම්කරු විය යුත්තේ නිසි බලධරයා වේ.

(2) නැවේ ව්‍යුහය මත අධික ආතතීන් වැළැක්වීමට නෞකාධිපතිවරයාට හැකියාව ලබා දීම සඳහා, නැව් භාණ්ඩ මෙහෙයුම් සඳහා වගකිව යුතු නැවේ නිලධරයන් හොඳින් දන්නා භාෂාවකින් ලියනු ලැබිය යුතු නැව් භාණ්ඩ පැටවුම් මාර්ගෝපදේශ අත් පොතක් නැවට දෙනු ලබන බව තහවුරු කිරීම නැවේ හිමිකරුගේ කාර්යය විය යුතු ය.

එසේ වුවද, මෙම භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවන්නේ නම්, නැවට, ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද මාර්ගෝපදේශ අත්පොතක් ද සපයනු ලැබිය යුතු ය. මාර්ගෝපදේශ අත්පොත පොත් පිංච එකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත විය හැකි අතර, අවම වශයෙන්-

(අ) සම්මුතියේ II-I වන පරිච්ඡේදයේ 5-1 වන නියෝගයෙන් නියම කරනු ලබන තාක් දුරට, ස්ථායිතාව පිළිබඳ දත්ත;

(ආ) ස්ථායිතාව රැක ගැනීමට පිරවුම් ද්‍රව්‍ය යෙදීමේ සහ ඉවත් කිරීමේ සීඝ්‍රතාවයන් සහ ධාරිතාවන්;

(ඇ) ටැංකියේ ඉහළ තලයේ මතුපිට ප්‍රදේශයේ ඒකක එකකට පැටවීමට අවසර දිය හැකි උපරිම බඩු ප්‍රමාණය;

(ඈ) නැවේ බඩු කුටියට පැටවීමට අවසර දිය හැකි උපරිම බඩු ප්‍රමාණය;

(ඉ) නැවට බඩු පැටවීම, නැවෙන් බඩු බෑම, ස්ථායිතාව රැක ගැනීමට පිරවුම් ද්‍රව්‍ය යෙදීමේ ක්‍රියාවන් සහ මුහුදු ගමන අතරතුර ඇතිවිය හැකි වඩාත් අහිතකර මෙහෙයුම් තත්ත්වයන් සඳහා වන යම් සීමා කිරීම් ඇතුළුව නැවේ ආකෘතියේ ශක්තිමත්භාවයට අදාළව නැවට බඩු පැටවීමේ සහ නැවෙන් බඩු බෑමේ සාමාන්‍ය උපදෙස්;

(ඊ) අදාළ වන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ යම් පිළිගත් සංවිධානයක් විසින් පනවනු ලබන වඩාත් අහිතකර මෙහෙයුම් තත්ත්වයන් සඳහා වන සීමා කිරීම් වැනි යම් විශේෂ සීමා කිරීම්; සහ

(උ) ශක්තිමත්භාවය පිළිබඳ ගණනය කිරීම අවශ්‍ය වන අවස්ථාවල දී, නැවට බඩු පැටවීම, නැවෙන් බඩු බෑම සහ මුහුදු ගමන අතරතුර දී නැවේ බඳ මත ඇති කිරීමට අවසර දිය හැකි උපරිම බල සහ බල ඝූර්ණයන්;

ඇතුළත් විය යුතු ය.

(3) ඝන තොග භාණ්ඩ පැටවීමට හෝ නැවෙන් බෑමට පෙර, නෞකාධිපතිවරයා සහ පර්යන්ත නියෝජිතයා විසින්, බඩු පැටවීමේ සහ බඩු බෑමේ අපේක්ෂිත වේගය, අපේක්ෂිත pours සංඛ්‍යාව සහ නැවේ ස්ථායිතාව රැක ගැනීම සඳහා පිරවුම් ද්‍රව්‍ය යෙදීමේ සහ ඉවත් කිරීමේ හැකියාව සලකා බලා-

(අ) භාණ්ඩ නැවට පැටවීමේ දී සහ නැවෙන් බෑමේ දී නැව මත ඇති කිරීමට අවසර දිය හැකි බල සහ බල ඝූර්ණයන් ඉක්මවා නොයන බව තහවුරු කළ යුතු; සහ

(ආ) බඩු පැටවීමේ දී හෝ බෑමේ අනුපිළිවෙල, ප්‍රමාණය සහ සීඝ්‍රතාව ඇතුළත් විය යුතු;

සැලැස්මකට එකඟ විය යුතු ය. සැලැස්ම සහ එයට පසුව සිදු කෙරෙන යම් සංශෝධනයක් වරාය අයත් රාජ්‍යයේ නිසි බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) බඩු පැටවීමේ සහ බඩු බෑමේ මෙහෙයුම් (3) වන අනුනියෝගය යටතේ එකඟ වන ලද සැලැස්මට අනුකූලව සිදු කෙරන බවට නෞකාධිපතිවරයා සහ පර්යන්ත නියෝජිතයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(5) බඩු පැටවීම හෝ බඩු බෑම අතරතුර දී (2) වන අනු නියෝගයේ සඳහන් කරන ලද නැවේ යම් සීමාවන් ඉක්මවා යන්නේ

නම් හෝ එසේ වීමට ඉඩ ඇත්තේ නම් සහ බඩු පැටවීම සහ බඩු බෑම අඛණ්ඩව සිදු වන්නේ නම්, නෞකාධිපතිවරයාට, මෙහෙයුම් අත්හිටුවීමේ අයිතිය ඇති අතර සැලැස්ම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ කවර වරාය අයත් රාජ්‍යයක් වෙත ද එම වරාය අයත් රාජ්‍යයේ නිසි බලධරයා වෙත ඒ පිළිබඳව දැනුම් දීමේ බැඳීම ඇත. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බවට නෞකාධිපතිවරයා සහ පර්යන්ත නියෝජිතයා විසින් සහතික විය යුතු ය. භාණ්ඩ බෑමේ දී, බඩු බෑමේ ක්‍රමවේදය මගින් නැවේ ව්‍යුහයට හානියක් සිදු නොවන බවට නෞකාධිපතිවරයා සහ පර්යන්ත නියෝජිතයා විසින් සහතික විය යුතු ය.

(6) නැවේ සේවක පිරිස විසින් අඛණ්ඩව නැව් භාණ්ඩ මෙහෙයුම් සමීක්ෂණය කරනු ලබන බවට නෞකාධිපතිවරයා විසින් සහතික විය යුතු ය. හැකි අවස්ථාවල දී, සපයනු ලබන ටොන් ප්‍රමාණයන් තහවුරු කර ගැනීම සඳහා බඩු පටවන සහ බඩු බාන අතරතුර දී නැවේ කිඳුම් ප්‍රමාණය විධිමත් ලෙස පරීක්ෂා කරනු ලැබිය යුතු ය. එක් එක් කිඳුම් ප්‍රමාණය සහ ටොන් ප්‍රමාණ නිරීක්ෂණ නැව් භාණ්ඩ සටහන් පොතක වාර්තා කරනු ලැබිය යුතු ය. (3) වන අනුනියෝගය යටතේ එකඟවන ලද සැලැස්මෙන් සැලකිය යුතු අපගමනයක් අනාවරණය වන්නේ නම්, අපගමනයන් නිවැරදි කර ඇති බව සහතික කිරීම සඳහා නැව් භාණ්ඩ හෝ නැවේ ස්ථායිතාව රැක ගැනීමට යොදන පිරවුම් ද්‍රව්‍ය (බැලස්ට්)මෙහෙයුම් හෝ එකී දෙවර්ගයම උචිත ලෙස සකස් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ධාන්‍ය ප්‍රවාහනය

14.(1) මේ නියෝගවල අදාළ වෙනත් යම් නියමයන්ට අමතරව, ධාන්‍ය රැගෙන යන භාණ්ඩ නැවක් විසින් ජාත්‍යන්තර ධාන්‍ය සංග්‍රහයට අනුකූල විය යුතු අතර, එම සංග්‍රහයෙන් නියම කරනු ලබන පරිදි බලය පවරා දීමේ ලේඛනයක් තබා ගත යුතු ය.ශ්‍රී ලංකා නැවක් සම්බන්ධයෙන් වන විට එම ලේඛනය අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානයක් විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. මේ නියෝගයේ කාර්ය සඳහා, අන්තර්ජාතික ධාන්‍ය සංග්‍රහයේ නියමයන් අනිවාර්ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (අ) යම් ශ්‍රී ලාංකික නැවක්, ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත දී, 1 වන අනු නියෝගයේ සඳහන් කරන ලද බලය පවරා දීමේ ලේඛනය තබා ගැනීමට අපොහොසත් වන අවස්ථාවක දී, එම නැව ජාත්‍යන්තර ධාන්‍ය සංග්‍රහයේ යෝජිත බඩු පැටවීමේ තත්ත්වයෙන් එහි නියමයන්ට අනුකූල වන බවට නෞකාධිපතිවරයා විසින්, බඩු පැටවීමේ වරායේ ගිවිසුම්ගත ආණ්ඩුවේ නිසි බලධරයා සෑහීමට පත් කරන තෙක් නැවට ධාන්‍ය නොපැටවිය යුතු ය;

(ආ) ශ්‍රී ලාංකික නැවක් නොවන යම් නැවක් (1) වන අනු නියෝගයේ සඳහන් කරන ලද බලය පවරා දීමේ ලේඛනය තබා ගැනීමට අපොහොසත් වන අවස්ථාවක දී, එම නැව ජාත්‍යන්තර ධාන්‍ය සංග්‍රහයේ යෝජිත බඩු පැටවීමේ තත්ත්වයෙන්, එහි නියමයන්ට අනුකූල වන බවට නෞකාධිපතිවරයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත් කරන තෙක් නැවට ධාන්‍ය නොපැටවිය යුතු ය; සහ

(ඇ) (2) (අ) වන සහ (2) (ආ) වන අනු නියෝගවල සඳහන් කරන ලද අවස්ථා දෙකෙහි දී ම, එවැනි යාත්‍රාවල නෞකාධිපතිවරුන් විසින්, අවස්ථාවෝචිත පරිදි ගිවිසුම්ගත ආණ්ඩුවේ බලයලත් තැනැත්තකු හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අත්සන් කරන ලද ඒ බවට වන ලේඛනයක් ලබා ගත යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

15. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙද හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව

සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

16. සම්මුතියේ VI වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එවැනි පාදක සටහන්වල සඳහන් කරනු ලබන යෝජනා සම්මතයන්, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගවල කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

17. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටකෝලයේ විධිවිධානවල අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

18. මෙම නියෝගවල-

"සම්මුතිය" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, කලින් කල සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන අදහස් වේ;

"IMSBC සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වූ,MSC.268(85) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය සුරක්ෂිතතා කමිටුව විසින් සම්මත කරන ලද ජාත්‍යන්තර සමුද්‍රීය ඝන තොග නැව් භාණ්ඩ (IMSBC) සංග්‍රහය අදහස් වේ;

"ජාත්‍යන්තර ධාන්‍ය සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වූ MSC 23(59) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය සුරක්ෂිතතා කමිටුව විසින් සම්මත කරන ලද,ධාන්‍ය තොග වශයෙන් සුරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"රෝ-රෝ නෞකාව" යන්නෙන්, සම්මුතියේ II-2 වන පරිච්ඡේදයේ 3 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති පරිදි රෝ-රෝ අවකාශ හෝ විශේෂ වර්ගයේ අවකාශ සහිත වූ මගී නෞකාවක් අදහස් වේ;

"ශ්‍රී ලංකා වරාය අධිකාරිය" යන්නෙන්, 1979 අංක 15 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ විධිවිධාන යටතේ ස්ථාපනය කරන ලද ආයතනය අදහස් වේ; සහ

"කෙටි ජාත්‍යන්තර මුහුදු ගමන" යන්නෙන්, නැවේ ගමන් ගන්නා මගීන් හා නාවික සේවක මඩුල්ල සුරක්ෂිතව ගොඩ බැස්සවිය හැකි වරායකට හෝ ස්ථානයකට සැතපුම් 200ක් නොඉක්ම වූ දුරකින් ගමන් ගන්නා වූ ජාත්‍යන්තර මුහුදු ගමනකි. මුහුදු ගමන ආරම්භ කළ රටේ අවසන් වරාය සහ ගමනාන්ත වරාය අතර දුර හෝ යාම සහ ඊට ඇතුළත් මුහුදු ගමන සැතපුම් 600ක් නොඉක්මවිය යුතු ය. මුහුදු ගමන ආරම්භ කළ රටට ආපසු යාමට නැව විසින් තම ආපසු ගමන ආරම්භ කරන්නා වූ සැලසුම් කළ මුහුදු ගමනේ අවසන් වරාය ගමනාන්ත වරාය වන්නේ ය.

EOG 01 - 0247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.